**පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය**

**බස්නාහිර පළාත**

## මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (බස්නාහිර පළාත)

# තනතුරු පුරප්පාඩු

මෙම අධිකාරියේ පුරප්පාඩුව පවතින මතු දැක්වෙන තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | වාර්ෂික වැටුප් පරිමාණය (රු.) | වයස 2023.12.01 දිනට (අවුරුදු) |
|---|---|---|---|
| 01. කළමනාකරු (ධාවන) MM 1-1 | 01 | 53,175 +10 X 1,375 +15 X 1,910 +95,575 | 22ට නොඅඩු 45ට නොවැඩි* |
| 02. ප්‍රාදේශීය කළමනාකරු MM 1-1 | 02 | 53,175 +10 X 1,375 +15 X 1,910 +95,575 | |
| 03. අභ්‍යන්තර විගණක MM 1-1 | 01 | 53,175 +10 X 1,375 +15 X 1,910 +95,575 | |
| 04. පරිපාලන නිලධාරී(ධාවන) JM 1-1 | 01 | 42,600 +10 X 755 +18 X 1,135 +70,580 | |

*ඉහත උපරිම වයස් සීමාවන් අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.

## බඳවා ගැනීමේ සුදුසුකම්

### 01. කළමනාකරු(ධාවන) MM 1-1 : පුරප්පාඩු 01

**බාහිර අයදුම්කරුවන්**

ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය පරිපාලනය, ප්‍රවාහනය හා සැපයුම් සේවා, ඉංජිනේරු විද්‍යාව, කළමනාකරණය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) මගින් පිළිගැනෙන ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබාගැනීමෙන් පසු සංස්ථාවක ,මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර තුනක (3) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**සැ.යු: ප්‍රවාහන කළමනාකරණය සහ පරිගණක සාක්ෂරතාවේ විශිෂ්ට නිපුණතාවය අත්‍යාවශ්‍යය.**

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයකට අයත් තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**සැ.යු: ප්‍රවාහනය හා සැපයුම් සේවා ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.**

### 02. ප්‍රාදේශීය කළමනාකරු MM 1-1 : පුරප්පාඩු 02

**බාහිර අයදුම්කරුවන්**

ව්‍යාපාර / රාජ්‍ය පරිපාලනය, ප්‍රවාහනය හා සැපයුම් සේවා, මානව සම්පත් කළමනාකරණය (HRM), වාණිජ්‍යය, ඉංජිනේරු විද්‍යාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C) මගින් පිළිගැනෙන ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබාගැනීමෙන් පසු සංස්ථාවක,මණ්ඩලයක හෝ වානිජ්‍ය ආයතනයක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර තුනක (3) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**සැ. යු. මහජන සම්බන්ධතා සහ ප්‍රවාහන සේවා පිළිබඳව ලබා ඇති විශිෂ්ට නිපුණතාව අත්‍යාවශ්‍යය.**

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

කනිෂ්ඨ කළමනාකරු ගණයේ 1 වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයකට අයත් තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**සැ.යු: ක්ෂේත්‍ර කටයුතු පිළිබඳ පූර්ව සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.**

### 03. අභ්‍යන්තර විගණක MM 1-1 : පුරප්පාඩු 01

**බාහිර අයදුම්කරුවන් (පහත i හෝ ii හෝ iii හි දැක්වෙන සුදුසුකමක් සමග iv හි දැක්වෙන සේවා පළපුරුද්ද ලබා තිබීම)**

i. ව්‍යාපාර / රාජ්‍ය පරිපාලනය ,ගණකාධිකරණය , කළමනාකරණය හෝ වානිජ්‍යය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) මගින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හෝ

ii. ICASL අන්තර්මාධ්‍ය සහතිකය / ආවසරික II සහතිකය / CIMA හෝ ACCA හි තෙවන කොටස (Part iii) සමත්ව තිබීම.

හෝ

iii. ශ්‍රී ලංකා තාක්ෂණික විද්‍යාලය මගින් පිරිනැමෙන 'ගිණුම්කරණය සඳහා වන උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA ) සමත්ව තිබීම

සමග

iv. ඉහත සුදුසුකම් ලබාගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක ගණකාධිකරණ / විගණන ක්ෂේත්‍රයක ලද වසර තුනක (3) ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

කනිෂ්ඨ කළමනාකරු ගණයේ (ගිණුම් / විගණන නිලධාරී) 1 වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

### 04. පරිපාලන නිලධාරී(ධාවන) JM 1-1 : පුරප්පාඩු 01

**බාහිර අයදුම්කරුවන්**

i. ව්‍යාපාර / රාජ්‍ය පරිපාලනය, වානිජ්‍ය, ප්‍රවාහනය හා සැපයුම් සේවා ,සිවිල් ඉංජිනේරු විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව කළමනාකරණය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.(U.G.C.) මගින් පිළිගැනෙන ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසරක (1) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

කළමනාකරණ සහකාර ගණයේ 1 වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයකට අයත් තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

## බඳවා ගැනීමේ ක්‍රමවේදය

සියලුම බඳවා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදුකෙරේ.

සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ආකාරය පහත පරිදි වේ.

| නිර්ණායකය | ලකුණු ප්‍රමාණය |
|---|---|
| අදාළ අමතර පළපුරුද්ද සඳහා | 30 |
| අදාළ අමතර සුදුසුකම් සඳහා | 30 |
| වෙනත් කාර්යසාධන / ජයග්‍රහණ | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධන මට්ටම | 25 |
| **මුළු ලකුණු** | **100** |

## පත්වීමේ ස්වභාවය

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

## සේවා කොන්දේසි සහ පොදු විධිවිධාන

**සෑම අයදුම්කරුවෙක්ම,**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, බස්නාහිර පළාත තුළ අවම වශයෙන් වසර තුනක (3) ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම බස්නාහිර පළාත තුළ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත අයකු විය යුතුය.

iv. තෝරාගැනෙන බාහිර අයදුම්කරුවන් රාජකාරී භාරගත් දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත් කෙරෙන අතර, රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර කරනු ලැබ ඇති අයදුම්කරුවන් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් කෙරෙනු ඇත.

v. සෑම සේවකයෙක්ම සේවක අර්ථසාධක අරමුදලට 8% කින් දායක විය යුතු අතර, අධිකාරිය මගින් 12% ක් බැර කරනු ලැබේ.තවද සේවක භාරකාර අරමුදලට අධිකාරිය මගින් 3%ක් බැර කරනු ලැබේ.

vi. මීට අමතරව මාසික ජීවන වියදම් දීමනාව රු.7,800ක් සහ චක්‍රලේඛ මගින් ඒ ඒ තනතුරට අදාළව අනුමත ප්‍රතිලාභ සඳහා හිමිකම් කියනු ලැබේ.

## අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සිය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල ඡායාපිටපත් හා පදිංචිය සනාථ කරන ග්‍රාම සේවා සහතිකය තමා විසින් සකසා ගත් අයදුම්පතක් සමග අමුණා 2023.12.01 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අංශ ප්‍රධානීන් මගින් අයදුම්කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත්‍ර සහ අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර භාරගනු නොලැබේ. අයදුම් පත්‍ර ලැබුණු බවට දන්වා එවනු නොලැබේ.

**ඕ.ඩබ්. ප්‍රසන්න සංජීව**
**සභාපති**
**බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,**
**අංක 89, "රන්මඟපාය", කඩුවෙල පාර, බත්තරමුල්ල.**
**2023.11.10**